## පාඨකයන්ගේ ලිපි–1.

### කුකුලන් ඇති කරන්නන්ට පශු වෛද්‍යාංශයෙන් පණිවිඩයක්.

# “ශූවෙඩ්” නමැති කුකුල් වසංගතය.

—(o:o)—

ඩී. සී. ද සේසිංහ මහතා විසිනි.

කුකුළන්ට හැදෙන රෝග අතුරෙන් වසංගත රෝගය ඉතා දරුණු වූවකි. මේ රෝගය නිසා කුකුළන් ඇතිකරන්නන්ට සිදුවන අලාභහානි කෙතරම්දැයි කිව නොහැකි තරම්ය. අද අප අතර ඇති කුකුළන් ඇතිකරන්නන් සමග සාකච්ඡාවක යෙදුනොත් හැමදෙනාම පාහේ ප්‍රකාශ කරන්නේ මේ රෝගයෙහි ඇති භයානකකමයි. එයින් කුකුළන් මුදවා ගැනීමට යම්කිසි මාර්ගයක් ඇද්දැයි සොයා නොබැලීම අපගේ ඛේදයට කරුණකි. ගොවිතැන් දෙපාර්තමේන්තුවේ පශු වෛද්‍ය අංශය මගින් මේ රෝගය මැඩලීම පිළිබඳ නොමිලයේ කරන සේවය කුමක්දැයි පහතින් විස්තර කරනු ලැබේ.

කුකුළන් රංචුවකට මේ රෝගය වැළඳුණේ නම් ඔවුන් සියල්ලම පාහේ ඉතා වේගයෙන් මැරී යයි. රෝගය වැළඳුන සතුන් නානාප්‍රකාර රෝග ලක්ෂණයන්ට භාජනවේ. බඩගිනි මඳකම, පියාපත් හැකිළී යාම, කඩිනමින් ආශ්වාස ප්‍රශ්වාස කිරීම, මුඛයෙන් ඔජස් වැනි ද්‍රව්‍යයක් පිටවීම යනාදිය සාමාන්‍ය රෝග ලක්ෂණයෝයි. රෝගය වැළඳුන සියළු සතුන්ටම දරුණු අතීසාර රෝගයක් හටගැනීම විශෙෂ

ලක්ෂණයකි. මේ රෝගය වැළඳුනු සියළුම සතුන් මැරී ගියත් ඉතා ස්වල්ප දෙනෙකුගේ ජීවිතය බේරීමට ඉඩ තිබේ. ඔවුන් එසේ වුවත් නියම නිරෝගී සතුන් නොවෙනවා පමණක් නොව කල් පවතින සතුරු බාධවලට ගොදුරුවේ. වකුටු කරගත් හිස ඇතිවීම, කෑම කන්ට නැත්කරණවිට හිස කවාකාරයට කැරකීම, එසේත් නැතහොත් ශරීරයේ පසකට අංශබාග රෝගය වැළඳීම යනාදිය රෝගයෙන් සුවවූ පක්ෂීන්ගේ ලක්ෂණයෝය.

මේ රෝගය ඉතා භයානක අන්දමින් බෝවී යන නිසා කුකුළන් ඇතිකරන්නන් ඉතා කල්පනාකාරී විය යුත්තේය. රෝගයෙන් පෙළෙන සතුන් විනාශකර දමා ඔවුන්ගේ මළකඳන් පුළුස්සා ඒවා පොළව යට වළලා දැමිය යුතුයි. සතුන්ගේ පාවිච්චියට යොදන ලද පිදුරු ආදී දේවල් සියල්ලක් විනාශ කළ යුතුවා පමණක් නොව සතුන්ගේ වාසස්ථානයන්ට හුණු අළු ඉසී මෙන් විෂබීජ සියල්ලක් විනාශකර දැමීමටද අමතක නොකළ යුතුයි. සමහර කුකුළන් ඇතිකරන්නන් විසින් තමන්ගේ කුකුළන්ට මේ රෝගය වැළඳුන විට බලවත් වරදක් කරණ බව පිළිගත යුතු සාක්ෂ්‍යවලින් ඔප්පුවේ. රෝගය වැළඳුන සතුන් වහාම කුකුල් වෙළෙන්දෙකුට විකිණීමෙන් ඔවුන්ගේ සතුන් වසංගතයෙන් මුදාගත්තේයයි සිතාගත්තත් ඒ ක්‍රියාව බලවත් අපරාධයකි. මොවුන් රෝගය පතුරුවා හැරීමට මාර්ග යොදනවා පමණක් නොව අසල් වැසියන්ට ද බලවත් පාඩුවක් කරන්නෝය. මේ හයින් කල්පනාකරන්නෙකුට කුකුල් වෙළෙන්දාද මේ රෝගය පතුරුවා හරින්නෙක් සේ පෙනී යේ. කුකුල් වෙළෙන්දෙකුගෙන් යමෙක් සතුන් මිලයට ගත්තොත් අඩු කරමින් ඒ සතුන් සති දෙකක් පමණවත් වෙන් කර තබාගැනීම නුවණට හුරුවේ.

කුකුළන් ඇතිකිරීමෙන් දිවි පෙවෙත රක්ෂාකරණ අයවලුන් එමට සිටී. ඔවුන් තුළ මේ රෝගය සුවකිරීම පිළිබඳ නානාවිධ මත ඇතිවූවත් සතුටුදායක ප්‍රතිඵල ගෙන දෙන ඖෂධයක් සොයාගෙන නැතිබව ප්‍රකටය. සමහරු සිංහල බෙහෙත් ඖෂධයන් කෙරෙහි විශ්වාසය තබා අසනීපවූ සතුන්ට ඒවායින් ප්‍රතිකාර කළත් අසනීපය සුවකර ගැනීම උගහටය. දැනට පේරාදෙනියේ පශු වෛද්‍ය රසායනාගාරයෙහි වසංගතයෙන් කුකුළන් බේරාගැනීම සඳහා යම්කිසි ඖෂධයක් නිපදවා තිබීම කුකුළන් ඇතිකරන්නන්ට මහත් ශාන්තියකි. මේ ඖෂධයෙන් කුකුළන් කුඩා අවධියේම එන්නත් කළ පසු ඔවුන්ට ජීවිතාන්තය දක්වා කෙදිනකවත් වසංගත රෝග නොවැළඳෙන බව රෝගය පිළිබඳව එහි පවත්වන ලද පරීක්ෂණයන්ගෙන් සත්‍ය වශයෙන්ම පිළිගෙන තිබේ.

මේ ඖෂධය භාවිතයට යොදවා දැනට අවුරුදු පහක් පමණ ගතවූවත් එහි අගනා බලය කුකුළන් ඇතිකරන්නන් විසින් වටහා නොගැනීම අපගේ ඛේදයට කරුණක් වී තිබේ. පශු වෛද්‍ය අංශයේ නිලධාරීන් ගෙයක් ගෙයක් පාසා ගොස් මේ බෙහෙත නොමිලයේ එන්නත් කරදීමට සූදානම් වී සිටියත් ඊට අකමැති වන්නේ මේ පිළිබඳ තොරතුරු හරිහැටි නොදන්නා බැවිනි. මේ ඖෂධය කුකුළන්ට එන්නත් කරන්නේ කුකුළන් මරා දැමීමටය, නැත්නම් බිත්තර දැමීම නැවැත්වීමටය. එසේත් නැත්නම් කුකුල් පරම්පරාවම විනාශකර දැමීමට ආණ්ඩුව කරණ උපක්‍රමයකි. මේ යනාදී වශයෙන් සමහරු මිථ්‍යා අදහස් ප්‍රකාශ කරණවා පශු වෛද්‍යාංශයේ නිලධාරීන්ට අසන්ට ලැබී තිබේ. එසේම මේ නිලධාරීන් ගෙයක් පාසා ගොස් මේ රෝගය පිළිබඳ ඇති තතු නොසඟවා පෙන්වා කුකුළන්ට බෙහෙත් එන්නත් කර ගන්ට යයි කරුණාවෙන් ඉල්වන විට එය විහිළුවක් සේ භාරගන්නා උදවියද එමටය. කුකුළන්ට මේ බෙහෙත එන්නත් කිරීමෙහි පරමාර්ථය වන්නේ ලංකාවේ වසංගතයෙන් සම්පූර්ණයෙන් නිදහස්වූ කුකුල් පරම්පරාවක් ඇති කිරීම බව අපි තරයේ මතක් කර සිටිමු.

අන්තිම වශයෙන් සඳහන් කළයුතු පණිවුඩය නම් ගොවිකම් දෙපාර්තමේන්තුවේ පශු වෛද්‍යාංශය මගින් කුකුළන් ඇති කරන්නන්ට ලබා දී තිබෙන මේ ප්‍රස්ථාවෙන් නියම ප්‍රතිඵල ලබාගැනීමට තමන්ගේ කුකුළන්ට නොමිලයේ බෙහෙත් එන්නත් කිරීමෙන් ඔවුන් කුකුල් වසංගතය නමැති රුදුරු යක්ෂයාගෙන් බේරාගැනීමට උත්සාහ දැරිය යුතුය යන්නයි. තමාගේ පළාත භාර උප පශු වෛද්‍ය නිලධාරී මහතාට දැන්වීමෙන් මෙය නොමිලයේ කරගත හැකි බව කුකුළන් ඇතිකරන්නන් තවම නොදනී ද?